ෆෙයාර්ෆස්ට් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්
ඇක්සස් ටවර්ස් II (14 වන මහල),
අංක 278/4, යුනියන් පෙදෙස, කොළඹ 02,
ශ්‍රී ලංකාව.
Tel: 011-2428428 | Fax: 011-2438438 | Email: info@fairfirst.lk | Website: www.fairfirst.lk

# **රක්ෂණ සේවා තොරතුරු ලේඛනය (IPID)**

## **ෆෙයාෆස්ට් මොබිටෙල් රක්ෂණ ආවරණ සාරාංශය**

මෙම ලේඛනය ඔබේ රක්ෂණ ඔප්පුවේ ප්‍රධාන අයිතමයන්ගේ සාරාංශයකි. එය කියවීමට පහසු වන පරිදි නිර්මාණය කර ඇති නමුත් සම්පූර්ණ නියමයන් සහ කොන්දේසි අඩංගු නොවේ. සම්පූර්ණ විස්තර සඳහා ඔබ ඔබේ සම්පූර්ණ රක්ෂණ ප්‍රතිපත්ති ලේඛනය කියවිය යුතුය.

### **1 ප්‍රධාන ප්‍රතිලාභ**

1.1. **ආදායම් අහිමි වීමකදී:** අසනීපයක් හෝ අනතුරක් හේතුවෙන් රෝහල්ගත වීම සඳහා සතිපතා ගෙවීම්, (මෙය පළමු දිනය බැහැර කර ආවරණයේ පළමු මාස තුන තුළ සිදුවූවක් නම් ප්‍රතිලාභ 50% කින් අඩු කිරීමකට ලක් කර ලබාදෙනු ලැබේ)

1.2. **රැකියා අහිමි වීමකදී:** මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් සේවයෙන් පහ කිරීම, ඉවත දැමීම් හෝ සේවායෝජක ආයතනය වසා දැමීම වැනි කාරණා සඳහා එකවර වන්දි ගෙවීම  වැඩ කරන දින 7ක් ඇතුළත පියවනු ලැබේ.

1.3. **හදිසි මරණ ප්‍රතිලාභය:** මේ සඳහා අවශ්‍ය සියලුම ලියකියවිලි ඉදිරිපත් කිරීමෙන් පසු වැඩ කරන දින 7ක් ඇතුළත නාමිකයාට එකවර ගෙවීමක් සිදුකෙරේ.

### **2 මූලික බැහැර කිරීම් (ආවරණය නොවන්නේ මොනවාද)**

2.1. මෙම ප්‍රතිපත්තිය රෝහල්ගත වීමේ පළමු දිනය, තමා විසින් සිදුකරගත් තුවාල, ගැබ්ගැනීම් ආශ්‍රිත තත්වයන්, යුද්ධය, ත්‍රස්තවාදය සහ නීති විරෝධී ක්‍රියාකාරකම් හෝ අවදානම් ක්‍රීඩා වලින් සිදුවන තුවාල ආවරණය නොකරයි.

2.2. වංචා සහගත හේතූන් මත රැකියා ප්‍රතිලාභ අහිමි වීම්, දුර්වල ක්‍රියාකාරිත්වය හෝ ස්වේච්ඡා විරැකියාව හේතුවෙන් සේවය අවසන් කිරීම ආවරණය නොකරන අතර හදිසි අනතුරු මත සිදුවන මරණයන්, මත්පැන් භාවිතය මගින්, යුධමය තත්වයන් මත හෝ අධි අවදානම් ක්‍රීඩාවන් හේතුවෙන් සිදුවුනි නම් එවැනි සිදුවීම් ආවරණය නොකරයි.

### **3 සාමාන්‍ය කොන්දේසි**

a. රක්ෂණාවරණය වලංගු වන්නේ ශ්‍රී ලංකා භූමි සීමාව තුළ පමණක් වන අතර, වයස අවුරුදු 18 සිට 65 දක්වා පුද්ගලයන් සඳහා අදාළ වේ.

b. සිද්ධිය සිදු වූ දිනයේ සිට දින 90ක් ඇතුළත වන්දි ඉල්ලීම් ඉදිරිපත් කළ යුතු අතර, රෝහල්ගත කිරිමට අදල වන්දි ලබාගැනිම සඳහා රෝහලෙන් පිටවු දිනයෙන්, දින 60ක් ඇතුළත ඉදිරිපත් කළ යුතුය.

c. සියලු ගෙවීම් ශ්‍රී ලංකා රුපියල් වලින් සිදු කරනු ලබන අතර, මෙම ප්‍රතිපත්තිය ශ්‍රී ලංකා

නීතියට යටත්ව පාලනය වේ.

d. වාරික මුදලට අදාළ සියලු බදු ඇතුළත් වන අතර, රක්ෂණ ප්‍රතිපත්තිය ආරම්භයෙන් පළමු මාස තුන (03) තුළ සිදු කරන වන්දි ගෙවීම් 50% ක උපරිමයකට යටත්වේ.

## 4 හිමිකම් ක්‍රියාවලිය

a. රෝහල්ගත කිරීමේ හිමිකම්: සම්පූර්ණ කරන ලද හිමිකම් පෝරමයක්, රෝග විනිශ්චය කාඩ්පතක්, හැඳුනුම්පතක් සහ බැංකු විස්තර රෝහලෙන් පිටව ගොස් දින 60ක් ඇතුළත ඉදිරිපත් කරන්න.

b. රැකියා අහිමි වීමේ හිමිකම්: රැකියාව තහවුරු කිරීමේ ලිපි ලේඛණ, වැටුප් පත්‍රිකා සහ EPF/ETF සහතිකය ඉදිරිපත් කරන්න.

c. හදිසි මරණ හිමිකම්: මරණ සහතිකයක්, පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාවක් සහ පොලිස් වාර්තාවක් (පොලිස් වාර්තාව අදාළ නම්) ඉදිරිපත් කරන්න.

## 5 පැමිණිලි සහ දුක්ගැනවිලි හැසිරවීම

5.1. පියවර 1 - ෆෙයාර්ෆස්ට් ඉන්ෂුවරන්ස් ආයතනය අමතන්න.

☎ +94 11242 8282 (8:30 a.m. to 5:00 p.m.)

✉ info@fairfirst.lk

ඔබට ඔබගේ ගැටළු ෆෙයාෆස්ට්හි අවදානම් සහ අනුකූලතා කණ්ඩායම වෙත යොමු කළ හැකිය.

5.2. පියවර 2 - බාහිර ආයතනයකට යොමු කිරීම (ගැටළුව විසඳා නොමැති නම්):

a. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව :IRCSL)

☎ +94 11 2335167 | ✉ info@ircsl.gov.lk | www.ircsl.gov.lk

b. රක්ෂණ ඔම්බුඩ්ස්මන් / Insurance Ombudsman

☎ +94 11 2505542 / +94 11 2505041 | ✉ info@insuranceombudsman.lk | www.insuranceombudsman.lk

## 6 වැඩි විස්තර සඳහා අප අමතන්න

ෆෙයාර්ෆස්ට් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්
ඇක්සස් ටවර්ස් II (14 වන මහල),
අංක 278/4, යුනියන් පෙදෙස, කොළඹ 02, ශ්‍රී ලංකාව.
☎ 011-2428428 | ✉ info@fairfirst.lk | www.fairfirst.lk